
# රනිල් වික්‍රමසිංහ
## දර්ශනය
## සහ
## සාම මාවත



ශාස්ත්‍රපති
**ඇල්. ඒ. ජයරත්න**

4839

# රනිල් වික්‍රමසිංහ දර්ශනය
# සහ
# සාම මාවත

07 OCT 2016

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය
ප්‍රවේශ අංකය 4839
වර්ග අංකය 923

ප්‍ර. අංක 4839
වර්ග (අංක) 923
දිනය 20.09.2016

ප්‍රථම මුද්‍රණය : 2005

නව මුද්‍රණය : 2015

රනිල් වික්‍රමසිංහ දර්ශනය සහ සාම මාවත

© ඇල්. ඒ. ජයරත්න

ISBN 978-955-30-6324-3

කවර නිර්මාණය:

ගොඩගේ පොත් මැඳුර

පරිගණක පිටු සැකසුම:

ගොඩගේ පොත් මැඳුර

ප්‍රකාශනය:

සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම

661, 665, 675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:

චතුර මුද්‍රණාලය

69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

17610/2479/500

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# රනිල් වික්‍රමසිංහ දර්ශනය
# සහ
# සාම මාවත

රචනය

**ඇල්. ඒ. ජයරත්න**
B.A, B.A. (Hons), M.A, Dip in Ed, SLEAS

පෙරවදන

**මහාචාර්ය ජී. ඇල්. පීරිස්**

පසුවදන

**ඇන්. වී. කේ. කේ. වේරගොඩ**

සීමාසහිත
ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම

# RANIL WICKRAMASINGHE'S PHILOSOPHY AND PEACE MOVEMENT


by

**L. A. JAYARATNE**
B.A, B.A. (Hons), M.A, Dip in Ed, SLEAS

**Foreword**

**PROFESSOR G. L. PERIS**
LLB Hons (Sri Lanka)
D.Phil (Oxford),PhD (SriLanka)
(Prof. Law Faculty Colombo University)

**Epilogue**

**N. V. K. K. WERAGODA**
BA(Ceylon), M.P.A. (Harvard), SLAS
P.G Diploma in development studies (Cambridge)
**Secretary General (U.N.P)**



**S. Godage & Brothers (Pvt.) Ltd.**

## පිළිගැන්වීම

මහා පැරකුම් යුගයක්

පතමින්

සිය

දිවිය

පුදා ක්‍රියාකරණ

මිළඟ

ජනපති

රනිල් වික්‍රමසිංහ

මැතිඳුන් වෙත

පිළිගන්වමි.

# පටුන


පෙරවදන ... .... .... .... .... .... ... ix

හැඳින්වීම ... .... .... .... .... .... ... xiii

01. රනිල් වික්‍රමසිංහගේ නෑ පරපුර .... ... 1

02. ළමා කාලය .... .... .... .... ... ... 2

03. කොළඹ විශ්ව විද්‍යාලයේ ඉගෙනීම .... ... 26

04. දේශපාලනයට පිවිසීම .... .... .... ... 33

05. යෞවන කටයුතු හා රැකී රක්ෂා අමාත්‍ය
වශයෙන් .... .... .... .... ... ... 49

06. අධ්‍යාපන අමාත්‍ය වශයෙන් .... ... ... 68

07. ඉවසිලිවන්තව, නැණ මෙහෙයවා
ගෙවූ කාලය .... .... .... ... ... 89

08. 2005 ජනාධිපතිවරණය .... .... ... ... 113

09. රනිල් වික්‍රමසිංහ හා ඉන්දීය රජය අතර
සම්බන්ධතාවය .... .... .... ... ... 145

10. ඇමරිකානු සංචාරය .... .... ... ... 156

11. බ්‍රිතාන්‍ය සංචාරය .... .... ... ... ... 163

12. රනිල් වික්‍රමසිංහගේ ආර්ථික දර්ශනය ... ... 172

13. කොටි ඊළම ඉල්ලීම .... ... ... ... 192

14. රනිල් වික්‍රමසිංහගේ සාම මාවත ... ... 248

15. රනිල් වික්‍රමසිංහ දර්ශනය ... ... ... 269

16. නව රජයේ අනාගත වැඩපිළිවෙළ ... ... 287

17. "ආසියාතික සාම විරුවාණෝ" ... ... 298

# පෙරවදන

මැතැවින් ලියන ලද චරිත කථාවක් සොයා ගැනීම වූකලී චරිත කථාවක් ලිවීම සඳහා සුදුසු වූ පරිදි මනාලෙස ගතකරන ලද ජීවිතයක් සොයා ගැනීම තරම්ම අති දුෂ්කර කාර්යයකැයි යන්න ලෝකයේ චරිත කථා ලියන ලේඛකයන් අතර වූ ප්‍රකට පිළිගැනීමකි.

සත්‍ය වශයෙන්ම චරිත කථා ලිවීම දුෂ්කර ව්‍යායාමයකි. ඒ මන්ද යත්, පෙර කී පරිදි ලියා තැබීමට තරම් සුදුසු වූ චරිතයක් සොයා ගැනීමත් ඒ චරිතය පිළිබඳව අගතියකින් තොරව ලිවීම සඳහා අවශ්‍ය තොරතුරු සම්පාදනය කර ගැනීම සඳහාත් දැරිය යුතු වෙහෙස අපමණ වන හෙයිනි. හුදෙක් තෝරාගත් චරිතයක මතුපිට පෙනුම පදනම් කරගෙන එම චරිතයෙහි රූප-ගුණ ලිවීම සෑහෙන්නේ නැත. ඒ සම්බන්ධයෙන් තොරතුරු එක්රැස් කිරීමේ, එම තොරතුරු පිළිවෙලකට සැකසීමේ සහ විශ්ලේෂණය කිරීමේ සංකීර්ණ ක්‍රියාවලියක් මෙම ව්‍යායාමය තුළ අඩංගු වෙයි. ඒ සඳහා කාලය. ශ්‍රමය සහ බුද්ධියත් සමහර විටෙක මුදල් ද වැයකරමින් ගැඹුරු පරියේෂණයක්ද කළ යුතුවෙයි.

කිසියම් පුද්ගලයකුගේ චරිත කථාව වූකලී එම පුද්ගලයා විසූ කාලය, එම කාලයට අයත් සමාජ, ආර්ථික, සහ

දේශපාලන ඓතිහාසික සන්දර්භය ආදිය පිළිබිඹු කරන්නාවූ ප්‍රකාශනයකි. එසේම එකී චරිතය විසින් එම කාලය කෙරෙහි ඇති කරනලද බලපෑමත්, එම කාලයෙහි වූ තත්ත්වයන් විසින් එම පුද්ගල චරිතයෙහි හැඩගැස්ම කෙරෙහි කරනලද බලපෑමත් චරිත කථාව තුළ නිරූපනය විය යුතුය. තවත් අතකින් ප්‍රස්තුත පුද්ගලයා කෙරෙහි එල්ලවූ අභියෝග කෙරෙහි දක්වනු ලැබූ ප්‍රතිචාර සහ එම අභියෝග දිනා ගැනීම සඳහා ගන්නා ලද වෑයම් මෙන්ම එහිදී භාවිත උපාය-උපක්‍රමද චරිත කථාවේ පරිපූර්ණත්වය රැක ගැනීමෙහිලා ඒතුළ අන්තර්ගත කිරීම අතිශයින් වැදගත්ය.

ඇල්. ඒ. ජයරත්න මහතා රනිල් වික්‍රමසිංහ මහතාගේ චරිත කථාව ලිවීමට අත ගැසීමෙන් ප්‍රවේශවී ඇත්තේ බලවත් අභියෝගාත්මක කාර්යයකටය.

එහි අභියෝගය වඩාත් බලවත් වන්නේ රනිල් වික්‍රමසිංහ චරිතය යනු ගෙවා අවසන් කරනලද චරිතයක් නොවන නිසාය. ඔහු අනාගතවාදී දෘෂ්ටියකට හිමිකම් කියන නූතන ලෝකයේ ජනනායකයෙක් වන හෙයින් එම චරිතයට සාධාරණයක් ඉටු කිරීම චරිත කථාව ලියන ලේඛකයාගේ යුතුකමක් සහ වගකීමක්ද වෙයි. ඕනෑම දේශපාලන චරිතයක් අනාගතයේ දවසක ජන විඥානයේ විනිශ්චාසනය මත විනිශ්චයකට භාජනය කෙරෙන නිසා එකී වගකීමෙහි භාරදූරත්වය සුවිශේෂීය.

රනිල් වික්‍රමසිංහ මහතා මා හඳුනාගත්තේ පශ්චාත් යටත්විජිත ශ්‍රී ලාංකික රාජ්‍යයත් සමාජයත් නූතනත්වයේ මාර්ගය ඔස්සේ ඉදිරියට ගෙන යන්නට වෙර දරන අධිෂ්ඨානශීලී නායකයකු ලෙස ය. අන් කවර නායකයකු වත් ඉදිරිපිට නැති තරමේ සංකීර්ණ අභියෝග රාශියක් ඔහු ඉදිරියේ තිබේ. මේ අභියෝග ජයග්‍රහණය කිරීම සඳහා ඔහු

ගන්නා පියවරයන් මත අනාගත ශ්‍රී ලංකාවේත් එහි වෙසෙන සියලු ජනතාවගේත් ඉරණම රැඳී පවතී.

දේශපාලන නිදහස ලබා පනස්හත් වසරක් ගත කරන ලද ශ්‍රී ලංකා රාජ්‍යය තවමත් ගතකරන ලද කාලයට සාපේක්ෂව ප්‍රමාණවත් ලෙස සංවර්ධනය වී නැති බව අප සියලු දෙනාම පිළිගන්නා කරුණකි. ඒ හේතුව නිසා මෙරට වෙසෙන සියලුම පුරවැසියන් ජීවත්වන්නේ අතෘප්තියෙනි. ඒ කිසිවෙකු තම ජිවිතය පිළිබඳ සෑහීමකට පත් නොවෙති. දිගු කලක් තිස්සේ යුද්ධයක්ව පැවැති ජාතික ප්‍රශ්නය හේතුවෙන් බහු ජනවාර්ගික ලාංකික සමාජයේ බහුතර ජනතාවත්, සුළුතර ජනතාවත් එක්නෙකා අතර පහසුවෙන් සමනය කළ නොහැකි මට්ටමේ දුරස්ථ වීමක් තිබේ. රට පාලනය කරන්නාවූ දේශපාලන පක්ෂ අතර ඇති ප්‍රතිපත්තිමය දුරස්ථ භාවයට අමතරව කාලයක් තිස්සේ පැවැත ආ ප්‍රතිවිරෝධයක් හේතුවෙන් සම්මුතික දේශපාලනය වෙනුවට බිහිවී ඇත්තේ සතුරු ප්‍රතිවිරෝධතාවයන්ය. ප්‍රචණ්ඩත්වයෙන් තොරව මැතිවරණයක් පවත්වා ගැනීම පවා සිහිනයක් පමණක් වන තැනට කරුණු යෙදී තිබේ. අල්ලස සහ දූෂණය මුළු මහත් රාජ්‍ය තන්ත්‍රයේ පමණක් නොව සෙසු ප්‍රධාන අංශ වලද ආයතනගත වෙමින් තිබේ.

ප්‍රචණ්ඩත්වය සහ හිංසනය එදිනෙදා ජනජීවිතයේ කොටස් බවට පත්ව ඇත. අකාර්යක්ෂමතාවය සහ මන්දගාමී බව හේතුවෙන් සමස්ත ජාතික ඵලදායීතාවයේ වේගය පවතින්නේ අවම මට්ටමකය. මේ අනුව ලාංකීය සමාජයේ මානව වටිනාකම් බෙහෙවින් සැහැල්ලුවට පත්ව තිබීම සිත් කලකිරවන සුළු තත්ත්වයකි. මේ සියලු ව්‍යාධීන්ට කඩිනමින් ප්‍රතිකාර කොට ශ්‍රී ලාංකික දේශය සුවපත් කිරීම මේ රටේ සියලු පුරවැසියන් ඉදිරියේ ඇති හදිසි සහ අත්‍යවශ්‍ය වගකීමකි.

ඒ අර්ථයෙන් ගත්කල රනිල් වික්‍රමසිංහ මහතාට ඒ පිළිබඳ මනා අවබෝධයක් ඇති බව මම තේරුම් ගෙන ඇත්තෙමි. එසේම ශ්‍රී ලංකා රාජ්‍යය ප්‍රතිසංස්කරණය කිරීමෙන් ආරම්භ කොට සියලුම ජනතාවගේ අවශ්‍යතා හැකිතාක් දුරට තෘප්තිමත් කළ හැකිවන ලෙස ශ්‍රී ලාංකික ජනසමාජයද නව මානයකින් නූතන ලෝකයට ගැලපෙන පරිදි යළි සකස් කිරීම සඳහා වූ අධිෂ්ඨානයක් වික්‍රමසිංහ මහතා තුළ ඇතැයි මම විශ්වාස කරමි. එය ඉවසිලිවන්තව ප්‍රඥා පෙරදැරිව ඉටුකළ යුතු දැවැන්ත කාර්යයකි.

මෙම කාර්යයට නායකත්වය දීමට රනිල් වික්‍රමසිංහ මහතාට හැකියාවක් වාසනා ගුණයක් ඇතත් ඔහුගේ දෙඅත ශක්තිමත් කරන්නට මේ රටේ සියලු ජනතාවගේ සහාය අවශ්‍යය. තනි තනිවත්, සාමූහිකවත් කල්පනා කරමින් අප ජීවත්වන, අපගේ දූදරු මුනුපුරන් ජීවත්වන්නට බලාපොරොත්තු වන මේ පින් බිම මිනිසුනට ජීවත්වීමට සුදුසු ප්‍රතිරූප දේශයක් බවට පත්කළ යුත්තේ අප විසිනි. ඒ සඳහා පුරෝගාමිත්වය ලබාදීමට ඉදිරිපත්ව සිටින රනිල් වික්‍රමසිංහ මහතා කෙරෙහි ජනතාවගේ විශ්වාසය වඩාත් තහවුරු කිරීම සඳහා ඇල්. ඒ. ජයරත්න මහතාගේ මෙම ග්‍රන්ථය මහඟු උපකාරයක් වනු ඇත. ඉදිරි අනාගතයේදී රනිල් වික්‍රමසිංහ නමැති නායකත්වය සමඟ එක්ව ඇද වැටී තිබූ ශ්‍රී ලංකා රාජ්‍යයත් ලාංකිය ජන සමාජයත් ගොඩනංවන ලද්දේ මේ කාලයේ ජීවත්වූ ධෛර්‍ය සම්පන්න මිනිසුන් රාශියක් විසිනැයි ඉතිහාසයේ සටහන් කර තබන්නට ඇල්. ඒ. ජයරත්න මහතාට වාසනාව ලැබේවා යැයි පතමින් මෙම පෙරවදන අවසන් කරමි.

*මහාචාර්ය ජී. ඇල්. පීරිස්*
LLB Hons (SriLanka) D.Phil (Oxford)
PhD (SriLanka)